# අශෝක බ්‍රාහ්මීය අක්ෂර හා ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මීය අක්ෂර පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

ඩබ්. ඒ. සෞම්‍යා ලක්මාලි*

මෙරට ඈත අතීතයේ සිටම අක්ෂර කලාවක් පැවතියේ ද යන්න විමර්ශනය කළ යුතු ප්‍රස්තුතයකි. මහින්දාගමනයට පෙර මෙරට අක්ෂර කලාවක් පැවතියේ ද එනම් එහි ස්වභාවය කෙබඳු දැයි අධ්‍යයනය වැදගත් වේ. ක්‍රිː පූ 3 වන සියවසට පෙර ශ්‍රී ලංකාවේ අක්ෂර පැවති බවට සාධක පැවතිය ද පිළිගත් මතය වන්නේ මහින්දාගමනයත් සමඟ අක්ෂර කලාව බිහි වූ බවයි. නමුත් මෙරට අක්ෂර කලාවක් තිබුනේ ද? අක්ෂර තිබෙන්නට ඇතැයි සිතීමට තරම් අශෝක අක්ෂර හා ශ්‍රී ලංකාවේ සමහර අක්ෂර අතර පවතින නොගැළපීම මූලික හේතුවක් විය. එනිසා ඊට පෙර අක්ෂර තිබුණා ද යන්න අධ්‍යයනය කිරීම මෙහි අධ්‍යයන ගැටලුවයි. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීක මූලාශ්‍ර ඇසුරු කර ගැනෙන අතර ප්‍රාථමික මූලාශ්‍ර වල දැක්වෙන කරුණු සනාථ කර ගැනිම සඳහා ද්විතීක මූලාශ්‍ර හා ඒ පිළිබඳ අදහස් දක්වන උගතුන්ගේ මතවාද සැලකිල්ලට ගැනෙයි. ඒ අනුව සාධක සහිතව නිශ්චය කළ හැකි මතවාදය/මතවාද ශාස්ත්‍රීයව සාකච්ඡාවට ලක් කිරීමට අපෙක්ෂා කෙරේ. මේ අනුව අශෝක බ්‍රාහ්මීය අක්ෂර මාලාව ලක්දිවට හඳුන්වා දීමට පෙර මෙරට අක්ෂර කලාවක් පැවති බව අනාවරණය කර ගත හැකිය.

ප්‍රමුඛ පද ː අක්ෂර කලාව, ප්‍රාථමික මූලාශ්‍ර , ද්විතීක මූලාශ්‍ර , අශෝක බ්‍රාහ්මීය අක්ෂර , ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මීය අක්ෂර

* සිංහල අධ්‍යයනාංශය goodlucklaky2@gmail.com